www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යුද්ධය අවසාන කිරීම සඳහා සමාජවාදී ඉදිරි දර්ශනයක්
# උතුරෙන් හා නැගෙනහිරෙන් ශ්‍රී ලංකා හමුදාව ඉවත් කරව්!

## A socialist perspective to end the war in Sri Lanka
## Troops out of north and eastern Sri Lanka!

**ලෝක සමාජවාදී වෙබ් අඩවියේ කර්තෘ මන්ඩල ප්‍රකාශය**
**2009 පෙබරවාරි 4**

ශ්‍රී ලංකාවේ පාලක පන්තිය ලංකා ස්වාධීනතාවේ 61 වන සංවත්සර උත්සවය පවත්වන අතරේ ම එම පාලක පන්තියේ සන්නද්ධ හමුදා උතුරේ මුලතිව් ප්‍රාන්තයේ අහිංසක දෙමල සිවිල් ජනයා මෘග ලෙස මරා දමමින් සිටිති. දශක ගනනාවක් තිස්සේ කරගෙන යන මේ වර්ගවාදී යුද්ධය වනාහී 1948 ස්වාධීනත්වයෙන් පසුව පිහිටුවන ලද ප්‍රතිගාමී රාජ්‍යය ගෙන ගිය දෙමල විරෝධී - ව්‍යායාමයේ කූටප්‍රාප්තිය යි. ශ්‍රී ලංකාව නමැති රාජ්‍යය (1948 දී) ඇති වූ තැන් පටන් ම එහි ධනපති පන්තිය තම බලය පවත්වා ගෙන යාම සඳහා කර ඇත්තේ දෙමල මුස්ලිම් හා සිංහල කම්කරු පන්තිය බෙදා ලීමට දෙමල විරෝධී දේශපාලනය යොදා ගත්තේ ය.

මහින්ද රාජපක්ෂගේ ආන්ඩුවේ යුද අපරාධ වනාහී අධිරාජ්‍යවාදී බලවතුන් විසින් ද ඔවුන්ගේ ජාතික ධනේශ්වර හුංගියන් විසින් ද සිය භූගෝලීය දේශපාලන ආසක්තයන් තහවුරු කර ගැනීම උදෙසා ඇෆ්ඝනිස්ථානයේ දී, ඉරාකයේ දී හා ගාසාවේ දී කල පරිදි ම මෘග ක්‍රම විධීන් කරා යොමු වීමේ තවත් උදාහරනයකි. අන්තර් අධිරාජ්‍ය ප්‍රතිමල්ලවතා විසින් දුවවනු ලැබ 1930 ගනන් වලින් මෙපිට ගොරතරම ලෝක ආර්ථික අර්බුදයකින් මෙහෙයවනු ලැබ ප්‍රධාන ධනපති රටවල් තුල ජනයාගේ අයිතිවාසිකම් හා ජීවන තත්වයන් සෝර ලෙස වනසා දැමීම සිදුවෙමින් පවතී. වර්ධනය වන්නා වූ යුදවාදය එය සමග බැඳී ඇත. යුරෝපය පුරාම විරැකියාවට සහ සාගත පිලිවෙත්වලට එරෙහිව වැඩී එන්නා වූ ව්‍යාපාරයක කොටසක් ලෙස ජනවාරි 29 දා ප්‍රන්සයේ දී මිලියන දෙක හමාරක් (ලක්ෂ 25ක්) කම්කරුවන් හා තරුනයෝ වැඩ වර්ජනය කොට වීදි බැස්සෝ ය.

ශ්‍රී ලංකාවේ පාලකයන් සිදු කරන මානුෂීය ව්‍යසනයට එරෙහිව ටොරොන්ටෝ, පැරිස්, ලන්ඩන් හා බර්ලින් නගරවල පෙලපාලිවලට ද දසලක්ෂ ගනන් දෙනා සහභාගී වූවෝ ය.

මෙම විරෝධතාවෝ වර්ගවාදී යුද්ධයට එරෙහි සැබෑ කෝපය ප්‍රකාශිත කෙරෙති. එහෙත් ඒවා බටහිර රටවල් හා ඉන්දියාව එය වැලැක්වීමට මැදිහත් විය යුතු ය යන ඉල්ලීමට සීමා වී පවතිති. එවන් ඉදිරි දර්ශනයක් යුද්ධයට වගකිව යුතු වූ ද ශ්‍රී ලංකාවේ ආන්ඩුවට යුද්ධමය හා රාජ්‍යතාන්ත්‍රික සහාය සපයන්නා වූ ද එම බලවතුන් පිලිබඳ මිථ්‍යාවන් වගා කරයි.

එල්ටීටීඊ සංවිධානයට පක්ෂපාතී වූ ''පුතිනම්'' වෙබ් අඩවිය පෙබරවාරි 1 දා ''ඉන්දියාව, ඉන්දියාව සියල්ලම ඉන්දියාව ම යි'' යන මැයින් ලිපියක් පල කලේ ය. එය ශ්‍රී ලංකාව තුල හා දකුනු ආසියාවේ ඉන්දියාව දරන අධිපති දේශපාලන හා යුද්ධමය භූමිකාව අවධාරනය කරමින්. විරෝධතා ප්‍රදර්ශනය කල යුතු වන්නේ ඉන්දියානු තානාපති කාර්යාල ඉදිරියේ ම පමනක් යැයි කියා සිටී.

එම වෙබ් අඩවිය ශෝචනීය තර්කයක් මෙසේ ඉදිරිපත් කරයි. ''ධවල මන්දිරය, ඩව්නිං වීදිය සහ ඔට්ටාවා නගරයේ ද වෙනත් බටහිර රටවල ද වීදිවල පැවැත්වෙන පෙලපාලි විසින් සිදු කෙරෙනු ඇත්තේ ඒ ඒ ආන්ඩුවලට අපහසුතාවයක් ඇති කිරීම පමනි.'' ඉක්බිති මෙය එසේ අනවයි, '' බටහිර රටවලට දැන් කිසිවක් ඉටු කර දීමට නොහැකි වුවත් අපට පසු කලෙක හෝ ඔවුන්ගේ ආධාරය අවශ්‍ය විය හැකිය. එහෙයින් අප ඔවුන්ට කරදර නොකල යුතු ය.''

පුතිනම් වෙබ් අඩවිය මේ මගින් කරන්නේ යුද විරෝධී පෙලපාලිවලට සහභාගී වන්නවුන්ගේ ඇස්වලට වැලි ගැසීමකි. කොලඹ ආන්ඩුව මෙම සාපරාධී යුද්ධය යලි අරඹා දිගින් දිගටම පවත්වා ගෙන යාමට සමත් වූයේ එයට ඉන්දියාවේ පමනක් නොව, එක්සත් ජනපදයේ ද කැනඩාවේ ද බ්‍රිතාන්‍යයේ ද ප්‍රන්සයේ ද ආධාර ලැබුනු හෙයිනි.

2005 නොවැම්බර් මාසයේ දී තේරී පත්වූවාට පසු, රාජපක්ෂ ආන්ඩුව 2002 සටන් විරාම ක්‍රමානුකූලව ගිවිසුම පිලිපැන්නවීමට කෙලින්ම ඉදිරියට ගියේ ය. යුද්ධය දියත් කිරීමට ශ්‍රී ලංකාවේ ආන්ඩුවට එක්සත් ජනපදයේ ද ඉන්දියාවේ ද ආධාරය ලැබුනි.

අනුපිලිවෙලින් 2006 මැයි ජූනි මාසවල දී කැනඩාව සහ යුරෝපීය සංගමය එල්ටීටීඊ සංවිධානය තහනම් කලෝ ය. යුරෝපීය සංගමය එල්ටීටීඊය තහනම් කලේ, එම සංවිධානය දේශපාලන විසඳුමකට සාකච්ඡා මේසයට ගෙන ඒමේ සඳහා දරන ලද උත්සාහයක කොටසක් ලෙස ය. එසමයෙහි අපි මෙසේ සඳහන් කලෙමු.

''මෙම තහනම විසින් ඉටු කෙරෙන්නේ සාමය ලං කිරීම නොවේ. ඒ වෙනුවට එය කරන්නේ 2002 සටන් විරාම එකඟතාවය බිඳ වැටීමේ අන්තරාය ලං කිරීමකි.'' ඉන් මසකට පසු, ශ්‍රී ලංකා හමුදාව එල්ටීටීඊ ප්‍රදේශය තුලට තම ප්‍රථම ප්‍රහාරය දියත් කලේ ය.

මෙම පාලක පන්තීන් හා ඔවුන්ගේ ආන්ඩු ඇෆ්ඝනිස්ථානයේ ද ඉරාකයේ ද ගාසා තීරයේ ද කර ගෙන යනු ලබන ආක්‍රමනයන්ට ද එමගින් කඩා පාත් කරනු ලබන විනාශයන්ට ද ඔවුන්ගේ රටවල වැඩ කරන ජනයා ජාත්‍යන්තරව තම සාමූහික විරෝධය දක්වා තිබේ.

ශ්‍රී ලංකාවේ තත්වය ගැන දැනුවත් කමක් ලැබුනොත් ජාත්‍යන්තර කම්කරු පන්තිය ඒ පිලිබඳව දක්වනු ඇත්තේ ද ඒ සමාන ම විරෝධයකි. දෙමල කම්කරුවන් තම අරගලය පොදු ධනපති සතුරාට එරෙහිව ලෝකය පුරාම කම්කරුවන් ගෙනයමින් සිටින්නාවූ අරගලය සමග ඒකාබද්ධ කල යුතු වේ.

කැනඩාවේ හා යුරෝපයේ පාලකයෝ එල්ටීටීඊ සංවිධානය තහනම් කර එම සංවිධානයේ කාර්යාලවලට කඩා වැදී ඒවායේ නායක කාර්යධරයන් අත් අඩංගුවට ගත්තෝය. එල්ටීටීඊ පෙරටු සංවිධාන, සංස්කෘතික මධ්‍යස්ථාන සහ සාප්පු පොලිසියේ ස්ථිර අධීක්ෂනය යටතට පත්කලහ.

එල්ටීටීඊයට එරෙහිව පියවරයන් ''ත්‍රස්තවාදය වැලැක්වීමේ'' පියවර ලෙස යුක්ති සහගත කරන යුරෝපීය සංගමය එම රටවලට සරන පතා පැමින සිටින දෙමල ජනයා නිරතුරුව ම ලංකාවට ආපසු හරවා එවයි. ජනවාරි 15 දා බ්‍රිතාන්‍ය ආන්ඩුව ඔවුන් විසින් ''බ්‍රිතාන්‍යයේ නීති විරෝධීව රැඳී සිටින්නවුන්'' යයි නම් කරන ලද පුද්ගලයන් ගනනාවක් ගුවන් යානයක පටවා ලංකාවට ආපසු එවී ය. සත්තකින්ම මාධ්‍ය වාර්තාවල දක්වන ලද පරිදි මෙසේ පටවා යවන ලද අය ගෙන් බහුතරය සිවිල් යුද්ධයෙන් ගැලවීම සඳහා සරන පතා බ්‍රිතාන්‍යයට පැමිනියවුන් ය.

අධිරාජ්‍ය බලවතුන් පසුපස ගමන් කරන එල්ටීටීඊය ඒ සමග ම ලංකාවේ යුද්ධය පිලිබඳව සිංහල කතාකරන වැඩ කරන ජනතාවට දොස් පවරයි. ඇත්ත වශයෙන් නම් පීඩිත සිංහල ජනතාව ද මේ යුද්ධයේ ගොදුරු ය.

සිංහල පාලක පන්තිය මෙම යුද්ධය යොදාගෙන ඇත්තේ වැඩ කරන ජනයාගේ ජීවන තත්වයන් සීමා රහිතව විනාශ කිරීම සඳහා ද ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් විනාශ කර දැමීම සඳහා ද වේ. ලංකාවේ ද විදේශගතව ද සිටිනා දෙමල ජනයාගේ සැබෑ මිතුරන් වන්නේ කම්කරු පන්තිය ය. අධිරාජ්‍යවාදී ලෝක පර්යායට එරෙහි අරගලයේ කොටසක් ලෙස යුද්ධය අවසාන කිරීමට ද ශ්‍රී ලංකාවේ ධනේශ්වර රාජ්‍යය පෙරලා දැමීමට ද දෙමල ජනයා ඇතුලු පීඩිත ජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන් රැකීමට ද පන්ති අවශ්‍යතාවයක් පවත්නා වූත් ඊට අවශ්‍ය සමාජ බලය ඇත්තා වූත් පන්තිය නම් කම්කරු පන්තියයි.

ප්‍රන්සයේ විරැකියාවට හා සමාජ සේවා කප්පාදුවට එරෙහිව ජනවාරි 29 මහා පෙලපාලිය ද යුරෝපය පුරා අරගලවල පූර්විකාවන් ය.

ප්‍රන්සයේ ද යුරෝපයේ ද දෙමල හා විදේශවලින් පැමිනි වෙනත් කම්කරුවෝ ද තරුනයෝ ද ඉස්මතුවන මෙම අරගලයන්ගේ වෙන් කල නොහැකි කොටස්කරුවෝ ය.

හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ද එහි තරුන අංශය වන සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර තරුනයෝ සංවිධානය ද ඔවුන්ගෙන් ඉල්ලා සිටින්නේ ආර්ථිකය කම්කරු පන්තියේ ප්‍රජාතන්ත්‍ර පාලනය යටතේ තබන්නාවූ විප්ලවවාදී සමාජවාදී ක්‍රියාමාර්ගයක් පදනම් කර ගත් නව දේශපාලන නායකත්වයක් ගොඩනැගීමට සටන් වදින ලෙස ය.

ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය පමනක් ම ජනවාර්ගික පදනම ඉක්මවමින් වැඩ කරන ජනතාව ඒකාබද්ධ කිරීමට ද එම පදනමේ සන්නද්ධ හමුදාවන් වහාම හා කොන්දේසි විරහිතව උතුරින් හා නැගෙනහිරින් ඉවත් කිරීමට ද සටන් කරයි. සසපය දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක් සඳහා අරගලය ඉදිරිපත් කරයි. එම මාවත පමනක් ම දැන් අර්ධ ශතවර්ශයකට අධික කාලයක් තිස්සේ මුලු මහත් ප්‍රදේශයට වසංගතයක්ව පවත්නා ජනවාර්ගික ආගමික හා කුලවාදී දේශපාලනය අවසන් කර දැමීම සඳහා මාවත වන්නේ ය.

© www.wsws.org